# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1773/37 – 2012 අගෝස්තු 30 වැනි බ්‍රහස්පතින්දා – 2012.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ ඕවල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/වයිටීඑන්/2011/302පී හා 2011.12.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0031ක් පමණ වන උඩමුදුනේහේන හෙවත් පරණවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – උඩමුදුනේහේන හෙවත් පරණවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0031ක් පමණ**

උතුරට: ඩබ්. එම්. ඒ. ටී. එම්. වලිසුන්දර හිමිකම් කියන උඩමුදුනේහේන හෙවත් පරණවත්ත; නැගෙනහිරට: ජලනළ මාර්ග රක්ෂිතය; දකුණට සහ බටහිරට: ඩබ්. එම්. ඒ. ටී. එම්. වලිසුන්දර හිමිකම් කියන උඩමුදුනේහේන හෙවත් පරණවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/4/2010/ඩබ්එස්/171.
2012 මැයි මස 31 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

09 – 423

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩමේ පරවශතාව පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාව අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින් ද යන්න 2 වැනි ඡේදයේ විස්තර වේ.

1. **පරවශතාවේ විස්තරය.**- මහනුවර දකුණ ජල සම්පාදන ව්‍යාපෘතියේ මඩරංගොඩ ජල ටැංකියේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක පරවශතාවය අත්කර ගැනීම.

**2. ඉඩමේ විස්තරය.**- මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ කොටබෝගොඩ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/වයිටීඑන්/2011/303පී හා 2011.12.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0273ක් පමණ වන මඩරංගොඩවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මඩරංගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0273ක් පමණ**

උතුරට: පී.පී. මහ 5872හි කැබලි අංක 1 සහ ටී. බී. දසනායක හිමිකම් කියන මඩරංගොඩවත්ත; නැගෙනහිරට සහ දකුණට: ටී. බී. දසනායක හිමිකම් කියන මඩරංගොඩවත්ත; බටහිරට: ටී. බී. දසනායක හිමිකම් කියන මඩරංගොඩවත්ත සහ පී.පී. මහ 5871හි කැබලි අංක 1.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/3/2011/ඩබ්එස්/24.
2012 ජූලි මස 24 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

09 - 424

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.